# ශ්‍රී ලංකා දේශයට විශිෂ්ඨයන් බිහි කළ කැලණිය මහා තක්ෂිලාව

එස්. එම්. ගෝඨාභය ජයරත්න

සිය ස්වර්ණ ජයන්තිය සමරණ කැලණිය විශ්ව විද්‍යාල පද්ධතිය තුළ කැලණිය විශ්ව විද්‍යාල පද්ධතිය තුළ කැලණිය විශ්ව විද්‍යාලයට වැදගත් තැනක් හිමි වන්නේ එයින් ජාතියට, ජාත්‍යන්තරයට බිහි කර, දායක කර ඇති හිහි පැවිදි උගතුන් බුද්ධිමතුන් විසින් කරන ලද ජාතික ජාත්‍යන්තර මෙහෙවර නිසාය, එමෙන්ම අධ්‍යාපන ආයතනයක් ලෙස ඇති දීර්ඝ මෙන්ම ප්‍රෞඪ ඉතිහාසයත් නිසාය. ක්‍රි.ව. 1875 නොවැම්බර් මස 01 වැනි දින රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමිපාණන් විසින් ආරම්භ කරන ලද විද්‍යාලංකාර පිරිවෙන වසර 135 ක් පමණ මෙරට දීර්ඝ කීර්තිමත් අධ්‍යාපන ඉතිහාසයකට විශාල දායකත්වයක් සපයයි. විදේශීය ආධිපත්‍යයට ගැති අධ්‍යාපනයකට හතුළු නිබූ අවධියක ජාතියේ ස්වාධීනත්වය හා අනන්‍යතාවය පවත්වා ගැනීමට මෙන්ම බෞද්ධ සාහිත්‍ය හා බැඳුනු දේශීයත්වය පෝෂණය කරමින් ක්‍රියාත්මක විය හැකි ස්වයංපෝෂිත සමාජ, ආර්ථික රටාවක් ගොඩ නැගීමට යුග මෙහෙවරක් එවකට ආරම්භ කරන ලද විද්‍යාලංකාර පිරිවෙණින් බව සියළුදෙනාම පිළිගත් යථාර්ථයයි. බෞද්ධ අධ්‍යාපන පුනරුත්ථාපනයත්, සිංහල, පාලි සංස්කෘත භාෂා ඇතුළු ඉතිහාසය පිළිබඳ අධ්‍යාපනයත්, විද්‍යාලංකාරය පාදක කර ගෙන විශේෂ සාහිත්‍යයක්ද ජාතික උරුමය, ස්වදේශිකත්වය පිළිබඳ නිදහස් චින්තනය අවධි කිරීම සඳහා ජාතික මෙහෙවරක් ඉටු කිරීමට විද්‍යාලංකාර පිරිවෙන 1957 අංක 45 දරණ විශ්වවිද්‍යාලය විද්‍යාලංකාර විශ්ව විද්‍යාල පනත අනුව 1959 ජනවාරි 01 දින 'ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය'' යනුවෙන් පිහිටුවන ලදි. සිංහල සරසවියක් ලෙස රටවැසියන් විසින් එවකට කැලණිය විශ්ව විද්‍යාල සංවාදයකට